# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 74 දරන ශ්‍රී ලංකා
# බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
# පනත

---

[සහතිකය සටහන් කළේ 1981 දෙසැම්බර් මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 දෙසැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිළ : රු. 1.20 යි                                                    තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනත

[සහතිකය සටහන් කළේ 1981 දෙසැම්බර් මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 28/81.

**ශ්‍රී ලංකාවෙහි හා විදේශ රටවල බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීම හා පාලි භාෂාව හැදෑරීම ප්‍රවර්ධනය කිරීම පිණිස සහ බුද්ධාගම හා පාලි භාෂාව පිළිබඳව විභාග පැවැත්වීම පිණිස ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පිහිටුවීම, පවත්වාගෙන යාම සහ පරිපාලනය කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

## I වන කොටස

### ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පිහිටුවීම

2. (1) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය යන නාමය හා අභිධානය ඇතිව මෙහි මින් මතු "විශ්වවිද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන විශ්වවිද්‍යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පිහිටුවීම.

(2) විශ්වවිද්‍යාලය, (1) වන උපවගන්තියෙන් එයට පවරන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර ඒ නාමයෙන් විශ්වවිද්‍යාලය විසින් නඩු පැවරීම ද විශ්වවිද්‍යාලයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

3. විශ්වවිද්‍යාලයේ අරමුණු පහත දැක්වෙන අරමුණු විය යුතු ය:— විශ්ව විද්‍යාලයේ අරමුණු.

(i) බුද්ධ ධර්මය ප්‍රචාරය කිරීම;

(ii) ශ්‍රී ලංකාවෙහි හා විදේශ රටවල පාලි භාෂාව හැදෑරීම ප්‍රවර්ධනය කිරීම; සහ

(iii) පෞද්ගලික ශිෂ්‍යයන් සඳහා ද පහත සඳහන් පරමාර්ථ එකක් හෝ වැඩි ගණනක් ඇති අනුබද්ධායතනවල ශිෂ්‍යයන් සඳහා ද විභාග පැවැත්වීම:—

(අ) ශ්‍රී ලංකාවෙහි හා විදේශ රටවල බුද්ධාගම පතුරුවාලීම සහ ධර්මදූත කටයුතු පෝෂණය කිරීම;

(ආ) පිරිවෙන්වල, පාසල්වල හා ඒ හා සමාන ආයතනවල බුද්ධාගම හා පාලි භාෂාව ඉගැන්වීම සඳහා භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම;

(ඇ) භික්ෂූන් වහන්සේලා අතර ආචාර ධර්මානුකූල පැවැත්ම හා මානසික ශික්ෂණය පවත්වාගෙන යාම හා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම ; සහ

(ඈ) ඉහත කී යම්කිසි කාරණයකට සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් යම් කාරණයක්.

විශ්වවිද්‍යාලයේ බලතල.

4. මේ පනතේ විධිවිධානවලට යටත්ව, විශ්වවිද්‍යාලයට පහත සඳහන් බලතල ඇත්තේ ය :—

(අ) විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන විභාගවල කාර්ය සඳහා අනුබද්ධායතනවල ශිෂ්‍යයන් හා පෞද්ගලික ශිෂ්‍යයන් ලියාපදිංචි කිරීම ;

(ආ) විශ්වවිද්‍යාලයේ විභාගවලින් සාමාර්ථ්‍යය ලැබූ තැනැත්තන්ට හා තැනැත්තන් වෙත උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ප්‍රදානය කිරීම හා පිරිනැමීම ;

(ඇ) බෞද්ධ හා පාලි භාෂා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා, පශ්චාත් උපාධි පර්යේෂණ කටයුතුවල යෙදී සිටින ප්‍රවීණතා දක්වා ඇති ශිෂ්‍යයන් උදෙසා පර්යේෂණ ශිෂ්‍යත්ව ඇති කොට ඔවුන්ට ඒ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සහ එහි ලා ඔවුන්ට මුදලින් ආධාර කිරීම ;

(ඈ) මහාචාර්ය තනතුරු, සහාය මහාචාර්ය තනතුරු, පරීක්ෂක තනතුරු හා විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් තනතුරු ඇති කිරීම ;

(ඉ) ශ්‍රී ලංකාවෙහි හෝ විදේශ රටක යම්කිසි අනුබද්ධායතනයක ශිෂ්‍යයන්ට සහ පෞද්ගලික ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාලයේ උපාධි, අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ඨතා ලබා ගැනීමට හැකි වීම පිණිස විභාග පැවැත්වීම ;

(ඊ) විශ්වවිද්‍යාලයේ සියලු තනතුරුවලට පත් කිරීම් කිරීම ;

(උ) මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මගින් හෝ අන්‍යාකාරයකින් විශ්වවිද්‍යාලය සතු විය හැකි යම්කිසි චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීම හා දැරීම සහ විශ්වවිද්‍යාලයේ නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට, සීමා කිරීම්වලට හා තහනම් කිරීම්වලට යටත්ව ඒ දේපළ විකිණීම, පැවරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඌ) සුදුසු අධ්‍යාපන ආයතන, විශ්වවිද්‍යාලයේ විභාග සඳහා අනුමත පාඨමාලා පවත්වන අනුබද්ධායතන වශයෙන් පිළිගැනීම ;

(එ) විශ්වවිද්‍යාලයේ අරමුණුවලට මුළුමනින් ම හෝ අර්ධ වශයෙන් සමාන අරමුණු ඇති, ශ්‍රී ලංකාවෙහි හෝ විදේශ රටක අධ්‍යාපනික හෝ වෙනත් ආයතන සමඟ ඒවායේ පොදු අරමුණු සඳහා හිතකර වන යම් කාර්ය සඳහා සහයෝගිතා ගිවිසුම්වලට එළඹීම ;

(ඒ) විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා පුස්තකාල සහ වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම සහ ඒවා නඩත්තු කිරීම ;

(ඔ) නියෝග මගින් කලින් කල නියම කරනු ලබන ගාස්තු ඉල්ලා සිටීම හා ඒ ගාස්තු ලබා ගැනීම ;

(ඕ) ණය මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් වූ නියෝගවලට අනුකූලව, අනුබද්ධායතනවල ශිෂ්‍යයන් විසින් බැංකුවලින් හෝ වෙනත් ආයතනවලින් ණය මුදල් ලබා ගැනීමෙහි ලා ඔවුන්ට සහාය වීම ;

(ක) විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයන්ගේ, නිලධරයන්ගේ හා වෙනත් සේවා නියුක්තයන්ගේ වාසය, විනය හා ශුභ සිද්ධිය විධිමත් කිරීම හා ඒ සඳහා විධිවිධාන සැලැස්වීම ; සහ

(ග) මේ පනතෙහි දැක්වෙන බලතල කිසිවක් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සහ 3 වන වගන්තියෙහි දැක්වෙන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

**වර්ගය, ඇදහීම, පංතිය හෝ ආගම පිළිබඳ වෙනස්කම් තහනම් බව.**

5. 4 වන වගන්තියේ (ඉ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන්නා වූ ද ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව වෙසෙන්නා වූ ද ස්ත්‍රී පුරුෂ සියලු තැනැත්තන්ට, ඔවුන් කවර වර්ගයකට, ආගමකට හෝ පංතියකට අයත් වුව ද විශ්වවිද්‍යාලය විවෘතව ඇත්තේ ය. එකී යම් තැනැත්තකුට විශ්වවිද්‍යාලයෙන් උපාධියක් ලැබීම හෝ විශ්වවිද්‍යාලයෙන් යම් වාසියක් ලබා ගැනීමට නැතහොත් එහි වරප්‍රසාද භුක්ති විඳීමට හිමිකම් ලබාදීම සඳහා ආගමික ඇදහීම හෝ ලබ්ධිය පිළිබඳ කිසිම පරීක්ෂණයක් ඇති කිරීම හෝ නියම කිරීම නොකළ යුතු ය :

එසේ වුව ද මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන බෞද්ධයන්ගේ අයිතිවාසිකම්වලට හා වරප්‍රසාදවලට කවර ආකාරයකින් හෝ අහිතකර නැතහොත් හානිදායක වන අයුරින් අර්ථ නිරූපණය කරනු නොලැබිය යුතු ය.

**විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතන.**

6. ශ්‍රී ලංකාවෙහි හෝ විදේශ රටක යම් අධ්‍යාපන ආයතනයක් විසින් හෝ පිරිවෙනක් විසින් කළමනාකරණය කරනු ලබන යම් අධ්‍යාපන ආයතනයක් විසින් හෝ විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතනයක් වශයෙන් පිළිගනු ලැබීම හා ලියාපදිංචි කරනු ලැබීම පිණිස විශ්වවිද්‍යාලයේ පාලක සභාව වෙත ලිඛිතව ඉල්ලුම් කරනු ලැබිය හැකි ය. පාලක සභාව විසින් නියෝග මගින් නියම කරනු ලබන කොන්දේසිවලට ඒ ආයතනය අනුකූල වන්නේ නම්, පාලක සභාව විසින් ඒ ආයතනය ලියාපදිංචි කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, විද්‍යෝදය හා විද්‍යාලංකාර යන මහ පිරිවෙන් දෙකින් යම් පිරිවෙනක් විසින් හෝ ඒ පිරිවෙන් දෙක ම විසින් ඒ ඒ පිරිවෙන්වල උසස් අධ්‍යාපන ආයතන පිහිටුවා ඒ ආයතන විශ්වවිද්‍යාලයේ අනුබද්ධායතන ලෙස පිළිගෙන ලියාපදිංචි කරන ලෙස පාලක සභාව වෙත ලිඛිතව ඉල්ලීමක් කළහොත්, පාලක සභාව විසින් ඒ ආයතන විශ්ව විද්‍යාලයේ ප්‍රධාන අනුබද්ධායතන වශයෙන් ලියාපදිංචි කර ඒවා දියුණු කිරීම පිණිස මුදලින් ආධාර දිය යුතු ය.

3—ඒ 59551 (81/11)

විශ්වවිද්‍යාලයේ පරීක්ෂණ සඳහා අනිවාර්ය විෂයයන්.

7. ප්‍රථම උපාධි පරීක්ෂණය සඳහා බුද්ධාගම හා පාලි භාෂාව අනිවාර්ය විෂයයන් විය යුතු ය. බුද්ධාගම හා සම්බන්ධ කවර හෝ විෂයයක් සහ පාලි භාෂාව පශ්චාත් උපාධි පරීක්ෂණය සඳහා අනිවාර්ය විය යුතු ය.

## II වන කොටස

### විශ්වවිද්‍යාලයේ මහා මහෝපාධ්‍යායයන් වහන්සේ සහ නිලධරයෝ

මහා මහෝපාධ්‍යායයන් වහන්සේ.

8. (1) (අ) සියම් නිකායේ මල්වතු පාර්ශ්වයේ මහා නායක හිමිපාණන් වහන්සේ ;

(ආ) සියම් නිකායේ අස්ගිරි පාර්ශ්වයේ මහා නායක හිමිපාණන් වහන්සේ ;

(ඇ) ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ තත්කාලයෙහි සභාපති ධුරය දරන මහා නායක හිමිපාණන් වහන්සේ ; සහ

(ඈ) ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ මහා නායක හිමිපාණන් වහන්සේ

මාරුවෙන් මාරුවට විශ්වවිද්‍යාලයේ මහා මහෝපාධ්‍යායයන් වහන්සේ විය යුතු අතර (අ) ඡේදයේ සඳහන් මහා නායක හිමිපාණන් වහන්සේගෙන් ආරම්භව ඒ එක් එක් හිමිපාණන් වහන්සේ විසින් වරකට අවුරුදු දෙකක කාලයක් ඒ ධුරය දැරිය යුතු ය.

(2) මහා මහෝපාධ්‍යායයන් වහන්සේ විශ්වවිද්‍යාලයේ ප්‍රධානයා වන අතර විශ්වවිද්‍යාලයේ යම් උපාධි ප්‍රදානෝත්සවයකට උන්වහන්සේ පැමිණ සිටින විටක, උන්වහන්සේ එහි මූලාසනය දැරිය යුතු ය.

(3) මහා මහෝපාධ්‍යාය ධුරය දරන මහා නායක හිමිපාණන් වහන්සේ අපවත් වූවහොත් නැතහොත් ධුරය දැරීම අත්හළහොත් ඒ මහා නායක ධුරයට අනුප්‍රාප්ත වන මහා නායක හිමිපාණන් වහන්සේ පූර්වගාමී මහා නායක හිමිපාණන් වහන්සේගේ ධුර කාලයෙන් ඉතුරු නොවී ඇති කාලය සඳහා මහා මහෝපාධ්‍යාය ධුරය දැරිය යුතු ය.

විශ්වවිද්‍යාලයේ නිලධරයෝ.

9. පහත සඳහන් තැනැත්තෝ විශ්වවිද්‍යාලයේ නිලධරයෝ වන්නාහ :—

(i) මහෝපාධ්‍යායයන් වහන්සේ ;

(ii) ලේඛකාධිකාරිවරයා ;

(iii) පුස්තකාලයාධිකාරිවරයා ;

(iv) මූල්‍යාධිකාරිවරයා; සහ

(v) තනතුරක් ලෙස නියෝග මගින් නියම කරනු ලැබූ වෙනත් යම් තනතුරක් යම් තැනැත්තකු විසින් දරනු ලබන කල්හි ඒ තැනැත්තා මේ පනතේ කාර්ය සඳහා නිලධරයකු වේ ද එබඳු යම් තනතුරක් දරන තැනැත්තා.

මහෝපාධ්‍යායයන් වහන්සේ.

10. (1) (අ) විශ්වවිද්‍යාලයේ ප්‍රථම මහෝපාධ්‍යායයන් වහන්සේ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන භික්ෂූන් වහන්සේ නමක් විය යුතු ය. සෑම තදනන්තර මහෝපාධ්‍යායයන් වහන්සේ නමක් ම පාලක සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන භික්ෂූන් වහන්සේ නමක් විය යුතු ය. මහෝපාධ්‍යායයන් වහන්සේ නමක් නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය. මහෝපාධ්‍යායයන් වහන්සේ ලෙස තමන් වහන්සේගේ අවසන් ධුර කාලය සම්පූර්ණ කිරීමෙන් ඉක්බිති අවුරුදු තුනක කාලයක් ඉකුත් වීමෙන් පසුව හැර කිසිම මහෝපාධ්‍යායයන් වහන්සේ නමක් මහෝපාධ්‍යාය වශයෙන් ධුර කාල දෙකක් සම්පූර්ණ කළ විට නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු නොවිය යුතු ය.

(ආ) ධුර කාලය ඉකුත් වීමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ස්වකීය ධුරය හිස් කරන යම් මහෝපාධ්‍යායයන් වහන්සේ නමකට තමා මහෝපාධ්‍යාය ධුරයට පත් කරනු ලැබීමට ඉහතින් දැරූ නිත්‍ය තනතුරකට පෙරළා පත්වීමට අයිතිවාසිකම තිබිය යුතු ය.

(ඇ) දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා කැඳවනු ලබන පාලක සභාවේ විශේෂ රැස්වීමක දී පාලක සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකින් සම්මත කර ගනු ලබන දෝෂාරෝපණ යෝජනාවක් මත, එකී මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(2) මහෝපාධ්‍යායයන් වහන්සේ විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයකු විය යුතු අතර එහි ප්‍රධාන විධායක නිලධරයා ද ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා ද විය යුතු ය. මහෝපාධ්‍යායයන් වහන්සේ නිල බලයෙන් පාලක සභාවේ සාමාජිකයකු විය යුතු ය. මහෝපාධ්‍යායයන් වහන්සේ පාලක සභාවේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. පාලක සභාවේ යම් රැස්වීමක් කැඳවීමට, එහි පැමිණ සිටීමට හා එහි දී කථා කිරීමට මහෝපාධ්‍යායයන් වහන්සේට හිමිකම ඇත්තේ ය.

(3) පාලක සභාව විසින් කලින් කල මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත නීත්‍යානුකූලව නිකුත් කරනු ලැබිය හැකි විධාන අනුව, මේ පනතෙහි හා යම් නියෝගයක විධිවිධාන යථා පරිදි පිළිපදින බවට වග බලා ගැනීම මහෝපාධ්‍යායයන් වහන්සේගේ කාර්යය විය යුතු අතර, ඒ කාර්යය සඳහා අවශ්‍ය යයි මහෝපාධ්‍යායයන් වහන්සේ සලකන සියලු බලතල මහෝපාධ්‍යායයන් වහන්සේට තිබිය යුතු ය. මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් ඒ බලතල ක්‍රියාත්මක කළ හැකි ය.

(4) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරන බවට වග බලා ගැනීම මහෝපාධ්‍යායයන් වහන්සේගේ කාර්යය විය යුතු ය.

(5) මහෝපාධ්‍යායයන් වහන්සේ විශ්වවිද්‍යාලයේ ගණන් දීමේ නිලධරයා විය යුතු ය.

(6) විශ්වවිද්‍යාලය තුළ විනය පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් මහෝපාධ්‍යායයන් වහන්සේ වග කිව යුතු ය.

(7) මහෝපාධ්‍යායයන් වහන්සේ කලින් ධුරය හිස් කරන හොත් නැතහොත් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අවුරුදු තුනක කාලයක් හෝ හැට අට වන විය සම්පූර්ණ කිරීම හෝ යන මෙයින් කලින් එළඹෙන අවස්ථාව තෙක් ධුරය දැරිය යුතු ය.

(8) නිවාඩු පිට සිටීම, අසනීප වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීම මහෝපාධ්‍යායයන් වහන්සේට තාවකාලිකව නොහැකි වුව හොත්, එසේ කාර්ය ඉටු කිරීමට නොහැකි වූ දින සිට දින දහ හතරක කාලයක් ඇතුළත ඒ ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යයි පාලක සභාව කල්පනා කරන යම් වැඩ පිළිවෙළක් පාලක සභාව විසින් යෙදිය යුතු ය. එවැනි වැඩ පිළිවෙළක් යොදනු ලබන තෙක් ලේඛකාධිකාරීවරයා විසින් ඒ ධුරයේ එදිනෙදා කටයුතු කර ගෙන යා යුතු ය.

ලේඛකාධිකාරී වරයා.

**11.** (1) ජනාධිපතිවරයා විසින් විශ්වවිද්‍යාලයේ ප්‍රථම ලේඛකාධිකාරීවරයා පත් කරනු ලැබිය යුතු ය. සෑම තදනන්තර ලේඛකාධිකාරිවරයකු ම පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. ඔහු බෞද්ධයකු ද විශ්ව විද්‍යාලයේ පූර්ණකාලීන නිලධරයකු ද විය යුතු අතර, මේ පනතින් හෝ යම් නියෝගයකින් ඔහු වෙත පවරනු ලබන හෝ නියම කරනු ලබන හෝ භාර කරනු ලබන සියලු බලතල, කාර්ය හා කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(2) විශ්වවිද්‍යාලයේ වාර්තා හා දේපළ භාරව සිටීම පිළිබඳව ලේඛකාධිකාරීවරයා පාලක සභාව වෙනුවෙන් වගකිව යුතු ය.

(3) ලේඛකාධිකාරීවරයා, නිලබලයෙන් පාලක සභාවේ ලේකම් වරයා විය යුතු ය.

(4) ලේඛකාධිකාරීවරයා විශ්වවිද්‍යාලයේ සභාකාර ගණන් දීමේ නිලධරයා විය යුතු ය.

(5) මහෝපාධ්‍යායයන් වහන්සේගේ විධානයට හා පාලනයට යටත්ව, විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය සහ එහි අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විනය පාලනය සම්බන්ධයෙන් ලේඛකාධිකාරී වරයා වගකිව යුතු ය.

පුස්තකාලයාධි කාරීවරයා.

**12.** (1) ජනාධිපතිවරයා විසින්, විශ්වවිද්‍යාලයේ ප්‍රථම පුස්තකාලයාධිකාරීවරයා පත් කරනු ලැබිය යුතු ය. සෑම තදනන්තර පුස්තකාලයාධිකාරීවරයකු ම පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. ඔහු විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධරයකු වන අතර, මේ පනතින් හෝ යම් නියෝගයකින් හෝ ඔහු වෙත පවරනු ලබන හෝ නියම කරනු ලබන හෝ භාර කරනු ලබන යම් බලතල, කාර්ය හා කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(2) මහෝපාධ්‍යායයන් වහන්සේගේ විධානයට හා පාලනයට යටත්ව, විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ පරිපාලනය සම්බන්ධයෙන් පුස්තකාලයාධිකාරීවරයා වගකිව යුතු ය.

මූලාධිකාරීවරයා.

**13.** (1) ජනාධිපතිවරයා විසින්, විශ්වවිද්‍යාලයේ ප්‍රථම මූලාධිකාරීවරයා පත් කරනු ලැබිය යුතු ය. සෑම තදනන්තර මූලාධිකාරීවරයකු ම පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. ඔහු ගිහි බෞද්ධයකු ද විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධරයකු ද විය යුතු අතර, මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ යම් නියෝගයකින් හෝ ඔහු වෙත පවරනු ලබන හෝ නියම කරනු ලබන හෝ භාර කරනු ලබන යම් බලතල, කාර්ය හා කර්තව්‍ය ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(2) ලේඛකාධිකාරීවරයාගේ විධානයට හා පාලනයට යටත්ව, විශ්වවිද්‍යාලයේ මුදල් පරිපාලනය කිරීම සම්බන්ධයෙන් ද නියෝග මගින් නියම කරනු ලබන යම් ආකාරයට හා පිළිවෙළට එහි ගිණුම් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් ද මූලාධිකාරීවරයා පාලක සභාව වෙනුවෙන් වගකිව යුතු ය. විශ්වවිද්‍යාලයේ අරමුදල් ඔහු භාරයේ තිබිය යුතු ය.

22 වන, 23 වන, 24 වන හා 25 වන වගන්තිවල විධිවිධාන ඇතැම් නිලධරයන් සම්බන්ධයෙන් අදාළ විය යුතු බව.

**14.** 22 වන, 23 වන, 24 වන හා 25 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මහෝපාධ්‍යායයන් වහන්සේ හැර සෑම නිලධරයකු සම්බන්ධයෙන් ම අදාළ විය යුතු ය.

## III වන කොටස

## විශ්වවිද්‍යාලයේ බලමණ්ඩලය

විශ්වවිද්‍යාලයේ බලමණ්ඩලය.

**15.** විශ්වවිද්‍යාලයේ බලමණ්ඩලය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විය යුතු ය.

පාලක සභාව.

**16.** (1) (මේ පනතේ "පාලක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාලයේ පාලක සභාව, විශ්වවිද්‍යාලයේ විධායක මණ්ඩලය හා පාලක මණ්ඩලය වන අතර, එය මහෝපාධ්‍යායයන් වහන්සේගෙන් ද ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙනත් සාමාජිකයන් දහහතර දෙනකුගෙන් ද සමන්විත විය යුතු ය. ඒ සාමාජිකයන් අතුරින් සාමාජිකයන් නව දෙනකු භික්ෂූන් වහන්සේලා විය යුතු ය.

(2) මහෝපාධ්‍යායයන් වහන්සේ පාලක සභාවේ සභාපතිවරයා වන අතර, එහි සියලුම රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. යම් රැස්වීමක මූලාසනය දැරීමට සභාපතිවරයාට නොහැකි වුවහොත්, සාමාජිකයන් විසින් පැමිණ සිටින යම්කිසි සාමාජිකයකු ඒ රැස්වීමෙහි මූලාසනය දැරීමට තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(3) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පාලක සභාවේ යම් පත් කළ සාමාජිකයකු, ඔහු කලින් ධුරය හිස් කරත හොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට ගණන් ගනු ලබන අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය. එවැනි සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය :

එසේ වුව ද, යම් පත් කළ සාමාජිකයකු තම ධුර කාලය ඉකුත් වීමට පෙර, තම ධුරය හිස් කරන්නේ නම්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින්, ඔහු කලින් ධුරය හිස් කරතහොත් මිස, තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(4) පාලක සභාවේ පත් කළ සාමාජිකයකු විසින්, තම අත්සන සටහනේ පාලක සභාව අමතා යවනු ලබන ලිපියක් මගින්, තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) පාලක සභාවේ අවසරය නොමැතිව පාලක සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණෙන පාලක සභාවේ පත් කළ සාමාජිකයකු, පාලක සභාවේ සාමාජිකයකු වශයෙන් වූ තම ධුරය අත්හැර ගිය ලෙස සැලකිය යුතු අතර, ඒ හේතුවෙන් ඇතිවන පුරප්පාඩුව පිරවීම සඳහා ජනාධිපතිවරයා විසින් සුදුසු තැනැත්තකු පත් කළ යුතු ය.

(6) පාලක සභාවේ සාමාජිකයකු යම් පාරිශ්‍රමිකයක් ලැබීමට හිමිකම් නොලබන නමුත්, ජනාධිපතිවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, නිශ්චය කරනු ලබන යම් දීමනාවක් ඒ සාමාජිකයාට ගෙවනු ලැබිය හැකි ය.

(7) පාලක සභාවේ යම් රැස්වීමක ගණපූරණය, එහි මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(8) වර්ෂයකට පාලක සභාවේ රැස්වීම් වාර දහයකට නොඅඩු සංඛ්‍යාවක් පැවැත්වෙන පරිදි, පාලක සභාව අවශ්‍ය කවර හෝ අවස්ථාවක රැස්විය යුතු ය.

(9) පාලක සභාවේ සභාපතිවරයා අවශ්‍ය යයි කල්පනා කරන කවර හෝ අවස්ථාවක නැතහොත් පාලක සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවකගෙන් ලිඛිත ඉල්ලීමක් ඔහු වෙත ලැබී එක් සතියක් ඇතුළත, පාලක සභාවේ සභාපතිවරයා විසින් පාලක සභාවේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය.

පාලක සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

**17.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, විශ්වවිද්‍යාලය වෙත පවරනු ලබන හෝ නියම කරනු ලබන හෝ භාර කරනු ලබන බලතල, කාර්ය හා කර්තව්‍ය පාලක සභාව විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් පාලක සභාව වෙත පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය පාලක සභාව විසින් ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය :—

(i) විශ්වවිද්‍යාලයේ දේපළ සහ අරමුදල් ඇරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම ;

(ii) විශ්වවිද්‍යාලය සඳහා කුල ලාංඡනයක් තෝරා ගැනීම සහ විශ්වවිද්‍යාලයේ පොදු මුද්‍රාවේ ආකෘතිය නිශ්චය කිරීම, එහි භාරය සඳහා විධිවිධාන සැලැස්වීම සහ එහි භාවිතය මෙහෙයවීම ;

(iii) මේ පනතේ හා යම් කිසි නියෝගයක විධිවිධානවලට අනුකූලව විශ්වවිද්‍යාලය හා සම්බන්ධ සියලු කාරණා, විධිමත් කිරීම හා නිශ්චය කිරීම ;

(iv) නිශ්චිත කාර්ය සඳහා වියදම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයට දී ඇති යම් අරමුදල් පරිපාලනය කිරීම ;

(v) අන්තිම කැමති පත්‍ර මගින්, පරිත්‍යාග මගින් හා ප්‍රදාන මගින් විශ්වවිද්‍යාලයට පවරනු ලබන දේපළ භාරගැනීම හා පිළිගැනීම ;

(vi) විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම් සලකා බැලීම සහ ඒ වාර්තාව සහ ඒ ගිණුම් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම ;

(vii) විශ්වවිද්‍යාලයේ විභාග සඳහා අනුමත කරන ලද අධ්‍යයන පාඨමාලා සැලැස්වීමේ කාර්යය සඳහා අනුබද්ධායතන වශයෙන් ආයතන ලියාපදිංචි කරනු ලැබිය හැකි වන්නේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි නියම කිරීම ;

(viii) විශ්වවිද්‍යාලයේ මුදල් ඇස්තමේන්තු පිළියෙල කිරීම ;

(ix) විශ්වවිද්‍යාලයේ නිලධරයන් හෝ වෙනත් සේවානියුක්තයන් වශයෙන් පත් කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් තීරණය කිරීම ;

(x) මේ පනතේ කාර්ය සඳහා නියෝග සෑදීම ;

(xi) විශ්වවිද්‍යාලයේ කටයුතු කර ගෙන යාම සඳහා අවශ්‍ය ලිබ්‍රු, උපකරණ සහ වෙනත් ද්‍රව්‍ය සැපයීම ;

(xii) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයෙන් හෝ ඉන් බැහැරින් හෝ මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ පරීක්ෂකවරයන් පත් කිරීම සහ ඔවුන්ට ගෙවනු ලබන වේතන හෝ ගාස්තු නිශ්චය කිරීම ;

(xiii) විශ්වවිද්‍යාලයේ සේවයෙහි නියුක්ත තැනැත්තන් පත් කිරීම, ඔවුන්ගේ සේවය අත්හිටුවීම, ඔවුන් සේවයෙන් පහ කිරීම හෝ අන්‍යාකාරයකින් ඔවුන්ට දඬුවම් කිරීම ;

(xiv) විශ්වවිද්‍යාලයේ මහා මහෝපාධ්‍යායන් වහන්සේගේ, නිලධරයන්ගේ සහ උපාධිධාරීන්ගේ උපාධි නෝපත්‍රය හෝ ලාංඡනය හෝ ඒ දෙකම නිශ්චය කිරීම ;

(xv) විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන විභාග සඳහා ශිෂ්‍යයන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය නියමයන් නිශ්චය කිරීම ; සහ

(xvi) විශ්වවිද්‍යාලයේ වෙනත් යම් බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මේ පනතින් වෙනත් කිසිම විධිවිධානයක් සලස්වා නොමැත්තේ ද ඒ වෙනත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම.

18. පාලක සභාව විසින් නිශ්චය කරනු ලබන යම් බලතල, කාර්ය හා කර්තව්‍ය ඇතිව, පාලක සභාවේ සාමාජිකයන් අතුරින් යම් සාමාජික සංඛ්‍යාවකින් හෝ වෙනත් තැනැත්තන්ගෙන් නැතහොත් ඒ දෙවර්ගයෙන් ම සමන්විත තත්කාර්ය කාරක සභා සහ නිශ්චිත කාර්ය සඳහා පාලක සභාව විසින් කලින් කල පත් කරනු ලැබිය හැකි ය. තත්කාර්ය කාරක සභා පත් කිරීම

## IV වන කොටස

### විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සව

විශ්වවිද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීම.

19. (1) විශ්වවිද්‍යාලය විසින්, උපාධි පිරිනැමීමේ කාර්යය සඳහා සෑම වර්ෂයක ම එක් වරක් මහා මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් අනුමත කරනු ලබන යම් දිනයක උපාධි ප්‍රදානෝත්සවයක් පවත්වනු ලැබිය යුතු ය:

එසේ වුව ද, නියමිත දින සිට මුල් තුන් අවුරුදු කාලය තුළ උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීම මහා මහෝපාධ්‍යායයන් වහන්සේගේ අභිමතය පරිදි විය යුතු ය:

එසේ ම තවදුරටත් මහා මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් කිසි අවස්ථාවක විශ්වවිද්‍යාලය විසින්, විශේෂ උපාධි ප්‍රදානෝත්සවයක් පවත්වනු ලැබිය හැකි ය.

(2) උපාධි ප්‍රදානෝත්සවයක කාර්ය පටිපාටිය නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

(3) පැමිණ සිටින විටක, උපාධි ප්‍රදානෝත්සවයක මූලාසනය මහා මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් දැරිය යුතු ය. මහා මහෝපාධ්‍යායයන් වහන්සේ පැමිණ නොමැති විටක මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් එකී මූලාසනය දැරිය යුතු ය.

## V වන කොටස

### කාර්ය මණ්ඩලයට කරනු ලබන පත් කිරීම්

කාර්ය මණ්ඩලයට කරනු ලබන පත් කිරීම් පාලක සභාව විසින් කළ යුතු බව.

20. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට කරනු ලබන සෑම පත් කිරීමක් ම, නියෝග මගින් නියමිත බඳවා ගැනීමේ කාර්ය පටිපාටිවලට හා පත් කිරීම් සඳහා වූ ක්‍රියා පිළිවෙළට අනුකූලව පාලක සභාව විසින් කළ යුතු ය.

(2) නියෝග මගින් නියමිත බඳවා ගැනීමේ කාර්ය පටිපාටිවලට හා පත් කිරීම් සඳහා වූ ක්‍රියා පිළිවෙළට අනුකූලව, පාලක සභාව විසින්, විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට පහත සඳහන් පත් කිරීම් කළ යුතු ය :—

(i) යම්කිසි නිලධර තනතුරකට පත් කිරීම සම්බන්ධයෙන් මේ පනත යටතේ වෙනත් විධිවිධාන නිශ්චිතව ම සලසා ඇති අවස්ථාවක හැර, ඒ නිලධර තනතුරට කරනු ලබන පත් කිරීම්;

(ii) වර්ෂයකට රුපියල් නව දහසකට නොඅඩු ආරම්භක වැටුපක් හෝ නියෝග මගින් කලින් කල පාලක සභාව විසින් නිශ්චය කරනු ලබන ඊට වැඩි වෙනත් යම් ආරම්භක වැටුපක් සහිතව නිලධරයකුගේ හෝ පරීක්ෂකවරයකුගේ තනතුරකට කරනු ලබන පත් කිරීමක් හැර, වෙනත් තනතුරකට කරනු ලබන පත් කිරීම්; සහ

(iii) නියෝග මගින් නියම කරනු ලැබිය හැකි වූ ද පත් කරනු ලබන තැනැත්තා තනතුරෙහි එක් ශ්‍රේණියක හෝ පංතියක සිට වෙනත් ශ්‍රේණියකට හෝ පන්තියකට උසස් කිරීම ඇතුළත් වන්නා වූ ද යම් කිසි තනතුරුවලට කරනු ලබන පත් කිරීම්.

තනතුරුවලට පත් කිරීම.

21. (1) පරීක්ෂකවරයකුගේ තනතුරකට හැර වෙනත් තනතුරකට කරනු ලබන සෑම පත් කිරීමක් ම, පළමුවෙන් අවුරුදු තුනක පරිවාස කාලයක් සඳහා වන අතර, ඊට පසු එය පාලක සභාව විසින් ස්ථිර කරනු ලැබීමට යටත් විය යුතු ය.

(2) පරීක්ෂකවරයකුගේ තනතුරකට කරනු ලබන සෑම පත් කිරීමක් ම සහ ඒ පරීක්ෂකවරයාගේ සේවා නියම හා කොන්දේසි, පාලක සභාව විසින් තත් කාර්යය සඳහා සාදනු ලබන නියෝගවලට අනුකූලව විය යුතු ය.

පරීක්ෂකවරයන් හැර වෙනත් තැනැත්තන් විශ්‍රාම ගැනීම.

22. පරීක්ෂකවරයකුගේ තනතුරක් හැර වෙනත් යම් තනතුරක් දරන තැනැත්තකු වයසින් අවුරුදු පනස් පහ සම්පූර්ණ කරන තුරු ඒ තනතුර දැරිය යුතු අතර, ඊට පසු ඔහු ස්වේච්ඡාවෙන් සේවයෙන් විශ්‍රාම ගත් ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද එවැනි යම් කිසි තනතුරක් දරන තැනැත්තකු විසින් ලිඛිත ඉල්ලීමක් කරනු ලැබූ විට, ඔහුගේ වයස අවුරුදු හැට සම්පූර්ණ වන තෙක් එක් වරකට එක් අවුරුද්දක කාලසීමාවක් බැගින් පාලක සභාව විසින් සේවය දීර්ඝ කිරීම කළ හැකි ය. ඊට පසු ඔහු විශ්‍රාම ගත් ලෙස සලකනු ලැබිය යුතු ය.

සේවයෙන් පහ කිරීමට හෝ අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීමට විරුද්ධව අභියාචනය කිරීම.

23. (1) පරීක්ෂකවරයකුගේ තනතුරක් නොවන යම්කිසි තනතුරක් දරන තැනැත්තකු විෂමාචාරය, අකාර්යක්ෂමතාව හෝ කාර්ය පැහැර හැරීම සම්බන්ධයෙන් මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් පරීක්ෂණයක් පවත්වන තෙක්, යම් වේලාවක සේවයෙන් අත්හිටවනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ පරීක්ෂණයක් අවසන් කරනු ලැබූ විට, විෂමාචාරය, අකාර්යක්ෂමතාව හෝ කාර්ය පැහැර හැරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු සේවයෙන් පහ කළ යුතු යයි ද නැතහොත් අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්විය යුතු යයි ද මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් පාලක සභාව වෙත නිර්දේශ කරනු ලැබිය හැකි ය. ඒ නිර්දේශ කිරීම පිළිබඳව මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් ඒ අවස්ථාවේ දී ම වරදකරු කරනු ලැබූ තැනැත්තා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) විෂමාචාරය, අකාර්යක්ෂමතාව හෝ කාර්ය පැහැර හැරීම සම්බන්ධයෙන් යම් තැනැත්තකු සේවයෙන් පහ කළ යුතු යයි නැතහොත් අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්විය යුතු යයි (2) වන උපවගන්තිය යටතේ මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් නිර්දේශ කරනු ලබන්නේ ද ඒ සෑම තැනැත්තකු විසින් ම, නිර්දේශ කිරීම තමා වෙත ලැබී දින දහහතරක් ඇතුළත ඊට විරුද්ධව පාලක සභාව වෙත අභියාචනය කළ හැකි අතර ඒ සම්බන්ධයෙන් පාලක සභාවේ තීරණය අවසානාත්මක විය යුතු ය.

රජයේ නිලධරයන් සහ පළාත් පාලන සේවයේ හෝ යම් පළාත් පාලන ආයතනයක සේවකයන් විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

**24.** (1) රජයේ සේවයේ යම් නිලධරයකු පාලක සභාවේ ඉල්ලීම පිට සහ ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්ගේ කැමැත්ත ඇතිව, එවැනි ම කැමැත්ත ඇතිව පාලක සභාව විසින් නිශ්චය කරනු ලබන යම් කාල සීමාවකට, විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ රජයේ සේවයේ යම් නිලධරයකුට හා නිලධරයකු සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු අතර ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ රජයේ සේවයේ යම් නිලධරයකුට හා නිලධරයකු සම්බන්ධයෙන් ඒ පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(3) යම් නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට එළඹ ඇති යම් තැනැත්තකු පාලක සභාව විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් විශ්වවිද්‍යාලය සඳහා සේවය කරනු ලබන යම් සේවා කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා, ඔහු විසින් ආණ්ඩුවට සේවය කරනු ලබන සේවා කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) පාලක සභාවේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ හෝ යම් පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු අවස්ථාවෝචිත පරිදි, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට පාලක සභාව විසින්, එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව පාලක සභාව සහ අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ පළාත් පාලන ආයතනය එකඟ වන, විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ඇතුළු යම් නියම හා කොන්දේසි මත ඒ නිලධරයා හෝ සේවකයා විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(5) රජයේ සේවයේ යම් නිලධරයකු හෝ පළාත් පාලන සේවයේ හෝ යම් පළාත් පාලන ආයතනයක නිලධරයකු හෝ සේවකයකු විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඔහු ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය.

*උසස් අධ්‍යාපන ආයතනවල නිලධරයන් හා සේවකයන් විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.*

**25.** (1) පාලක සභාවේ ඉල්ලීම පිට, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති යම් උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත නිලධරයකු, කථිකාචාර්යවරයකු, මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු හෝ සේවකයකු ඒ නිලධරයාගේ, කථිකාචාර්යවරයාගේ, මහාචාර්යවරයාගේ, සහාය මහාචාර්යවරයාගේ හෝ සේවකයාගේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ද ඒ ආයතනයේ පාලන බල මණ්ඩලයේ ද කැමැත්ත ඇතිව, පාලක සභාව විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට පාලක සභාව විසින් තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති යම් උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත යම් නිලධරයකු විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඔහු ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය.

## VI වන කොටස

## ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය අර්ථසාධක අරමුදල

*ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය අර්ථසාධක අරමුදල පිහිටුවීම.*

**26.** මෙහි මින් මතු " අර්ථසාධක අරමුදල " යනුවෙන් සඳහන් කරනු ලබන, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය අර්ථසාධක අරමුදල යනුවෙන් නම් කරනු ලබන හා හඳුන්වනු ලබන අර්ථසාධක අරමුදලක් විශ්වවිද්‍යාලය විසින් පිහිටුවනු ලැබිය යුතු ය.

*අර්ථ සාධක අරමුදල පාලනය කිරීම.*

**27.** අර්ථසාධක අරමුදල පිළිබඳ පාලනය, පරිපාලනය හා කළමනාකරණය සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කාරණා සඳහා ද පාලක සභාව විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

*අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවීම.*

**28.** (1) නියෝග මගින් බැහැර කරනු ලැබූ සාමාජිකයන් හැර, කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු විසින් ම, තමා සේවයෙහි නියුක්ත කරනු ලැබූ දිනයෙහි සිට සිය ඉපැයීම්වලින් සියයට දහයකට සමාන මුදලක් මාස්පතා සිය වැටුපෙන් කරනු ලබන එක සමාන අඩු කිරීම් මගින් අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ලැබිය යුතු අතර, ඒ හා සමගම විශ්වවිද්‍යාලය විසින් ඊට අතිරේක ව ඒ සෑම දායකයකු වෙනුවෙන්, ඒ දායකයාගේ ඉපැයීම් වලින් සියයට පහළොවකට සමාන මුදලක් හෝ පාලක සභාව විසින් නිශ්චය කරනු ලබන අන් කිසි මුදලක් හෝ අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ලැබිය යුතු ය.

(2) මූල්‍යාධිකාරිවරයා විසින් අර්ථසාධක අරමුදල සඳහා පොදු ගිණුමක් ද ඒ අරමුදලෙහි එක් එක් දායකයා වෙනුවෙන් වෙන ම ගිණුමක් ද ආරම්භ කොට, පවත්වා ගෙන යා යුතු ය. දායකයකු විසින් අර්ථසාධක අරමුදලට ගෙවනු ලැබූ සියලු දායක මුදල් ද ඒ දායකයා වෙනුවෙන් විශ්ව විද්‍යාලය විසින් ගෙවනු ලැබූ සියලු දායක මුදල් ද අර්ථසාධක අරමුදලෙහි ඒ දායකයාගේ ගිණුමේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) දායකයකුගේ ගිණුමෙහි බැරට ඇති මුදලට, පාලක සභාව විසින් සාදන ලද නියෝගවලට අනුකූලව ඒ දායකයා දායකයකු වීම නතර වන දිනය තෙක්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා පාලක සභාව විසින් නියම කරනු ලබන අනුපාතිකය අනුව වූ වැල් පොලිය ඒ වෙනුවෙන් පාලක සභාව විසින් සාදනු ලබන යම් නියෝගයකට යටත්ව, එකතු විය යුතු අතර ඒ දිනයේ දී ඒ දායකයාගේ ගිණුම වසා දැමිය යුතු ය. දායකයකුගේ බැරට එකතු වී ඇති මුදල ඒ ගිණුම වසා දමනු ලැබූ දිනයේ සිට මාස තුනක කාලයක් ඇතුළත ගෙවනු නොලැබූ අවස්ථාවක, මේ වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති අනුපාතිකය ම අනුව වූ පොලියක් ඔහුගේ බැරට ඇති මුළු මුදල ගෙවනු ලැබූ මාසයට ඉහතින් වූ මාසයේ අවසන් දිනය තෙක් ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද ඒ දායකයාට ඒ මුදල ගෙවීම පමා වූයේ දායකයාගේ යම් වරදක් නිසා වන අවස්ථාවක, ඔහුගේ ගිණුම වසා දමනු ලැබූ දිනයෙන් පසු උපචිත වන පොලිය ගෙවනු නොලැබිය යුතු ය.

දායකයන්ට මුදල් ආපසු ගෙවීම.

29. (1) 28 වන වගන්තියේ (3) වන උපවගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි යම් දායකයකු වෙත ගෙවිය යුතු මුදල 28 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව මූල්‍යාධිකාරීවරයා විසින් ඒ දායකයාට ගෙවනු ලැබිය යුතු ය.

(2) අසනීපවීම නිසා හෝ අශක්‍යතාවකට පත්වීම නිසා හෝ තමා සේවයෙහි නියුක්ත කරනු ලැබූ තනතුර අහෝසි කිරීම නිසා 28 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ දායකයකු වීම නතර වන දිනයට පෙර දායකයකු විශ්වවිද්‍යාලය විසින් සේවයෙහි නියුක්ත කරවීම නතර වන හෝ ඔහු විශ්වවිද්‍යාලයේ සේවයෙන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ලබන අවස්ථාවක, මූල්‍යාධිකාරීවරයා විසින්, 28 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඔහු එසේ සේවයෙහි නියුක්ත කරවීම අවසන් වූ දිනයේ දී අර්ථසාධක අරමුදලේ ඔහුගේ ගිණුමේ බැරට එකතු වී තිබූ මුළු මුදල ඒ දායකයාට ගෙවනු ලැබිය යුතු ය.

(3) 28 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ දායකයකු වීම නතර වන දිනයට පෙර දායකයකු විශ්වවිද්‍යාලයේ සේවයෙන් පහ කරනු ලැබූ අවස්ථාවක, මූල්‍යාධිකාරීවරයා විසින්, 30 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අර්ථසාධක අරමුදලෙහි ඒ දායකයාගේ ගිණුමෙහි බැරට ඇති මුළු මුදල, ඔහු සේවයෙන් පහ කිරීමේ දිනය තෙක් ඊට එකතු වූ පොලියත් සමග ඒ දායකයාට ගෙවනු ලැබිය යුතු ය.

(4) විශ්වවිද්‍යාලයේ සේවයෙහි නියුක්තව සිටිය දී දායකයකු මිය යන අවස්ථාවක, මූල්‍යාධිකාරීවරයා විසින්, 30 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, අර්ථසාධක අරමුදලෙහි ඒ දායකයාගේ ගිණුමේ බැරට එකතු වී ඇති මුළු මුදල මිය ගිය දායකයාගේ බූදලයට හෝ ඒ මුදලට නීත්‍යානුකූලව හිමිකම් ඇති තැනැත්තාට හෝ ගෙවනු ලැබිය යුතු ය.

**30.** මේ කොටසේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද එමෙන් ම වෙනත් යම් අයිතිවාසිකමකට හෝ ප්‍රතිකර්මයකට හානියක් නොමැතිව, දායකයකු විශ්වවිද්‍යාලය විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටි කාලය තුළ දී යම් අවස්ථාවක, ඔහුගේ වංචාභාවය නිසා හෝ නොසැලකිලිමත් බව නිසා හෝ විශ්වවිද්‍යාලයට දරන්නට සිදු වූ යම් පාඩුවක හෝ අලාභයක මුදල, අර්ථසාධක අරමුදලේ ඒ දායකයාගේ ගිණුමේ බැරට ඇති මුදල මත වූ ප්‍රථම වැය බරක් විය යුතු අතර, 29 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව යම්කිසි ගෙවීමක් කෙරෙන අවස්ථාවේ දී ඒ මුදල අඩු කරගනු ලැබිය හැකි ය.

අර්ථසාධක අරමුදලින් කරනු ලබන අඩු කිරීම ප්‍රථම වැය බරක් විය යුතු බව.

## VII වන කොටස

## මුදල්

**31.** විශ්වවිද්‍යාලයේ මුදල් වර්ෂය ආණ්ඩුවේ මුදල් වර්ෂය ම වන්නේ ය.

මුදල් වර්ෂය.

**32.** බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් විශ්වවිද්‍යාලයට විය යුතු අතර, ඒ අරමුදලට—

විශ්වවිද්‍යාලය අරමුදල.

(අ) යම් නියෝගයක විධිවිධාන අනුව විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු ගාස්තු ;

(ආ) පරිත්‍යාගවලින් ලැබෙන ආදායම් ;

(ඇ) ප්‍රතිපාදන වශයෙන් පාර්ලිමේන්තුව විසින් ලබා දෙන මුදල් ; සහ

(ඈ) විශ්වවිද්‍යාලයට කවර ප්‍රභවයකින් හෝ අයත් වන වෙනත් සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

**33.** (1) විශ්වවිද්‍යාලයට ආධාර වශයෙන් ප්‍රදානයක් හෝ ප්‍රදාන ලෙස, පාර්ලිමේන්තුව විසින් වාර්ෂික විසර්ජන මගින් හෝ පරිපූරක වැය ශීර්ෂ මගින් හෝ අන්‍යාකාරයකින් හෝ ප්‍රතිපාදනය කරනු ලබන මුදල්, එක් එක් මුදල් වර්ෂය ආරම්භ වීමෙන් පසු හැකිතාක් ඉක්මණින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින්, විශ්වවිද්‍යාලය වෙත ගෙවනු ලැබිය යුතු ය.

විශ්වවිද්‍යාලය සඳහා ආධාර වශයෙන් දෙනු ලබන ප්‍රතිපාදන.

(2) ඉහතින් වූ උපවගන්තිය යටතේ විශ්වවිද්‍යාලය වෙත ගෙවනු ලබන සියලු මුදල් මේ පනත මගින් බලය දෙනු ලැබූ කාර්ය සියල්ලම නැතහොත් ඉන් යම් කාර්යයන් සඳහා විශ්වවිද්‍යාලය විසින් යොදා ගනු ලැබිය යුතු ය ; නැතහොත් වැය කරනු ලැබිය යුතු ය.

**34.** පහත සඳහන් කාර්ය විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරීවරයාගේ කාර්ය වන්නේ ය :—

මූල්‍යාධිකාරීවරයාගේ කාර්ය.

(අ) නියෝග මගින් නියම කරනු ලබන පිළිවෙළට සහ ආකාරයට විශ්වවිද්‍යාලයේ ගිණුම් තබා ගැනීම ;

(අ) බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් භාර ගැනීම සහ ඒ මුදල් නිසි ගිණුම් ශීර්ෂ වලට බැර කිරීම ;

(ආ) බලය දෙනු ලැබූ සියලු ගෙවීම් කිරීම ; සහ

(ඇ) පාලක සභාව සඳහා ඉදිරි මුදල් වර්ෂයේ වාර්ෂික මුදල් විසර්ජන සහ පරිපූරක ඇස්තමේන්තු කිසිවක් පිළියෙල කිරීම :

එසේ වුව ද විශ්වවිද්‍යාලයේ ගිණුම්වල, නිශ්චිත කාර්ය සඳහා කරනු ලබන ප්‍රතිපාදනවලින් හෝ නිශ්චිත අරමුණු සඳහා වූ පරිත්‍යාගවලින් හෝ ලැබෙන ආදායම පිළිබඳව වෙනම ගණන් පෙන්විය යුතු අතර, විශ්වවිද්‍යාලයේ පොදු කාර්ය සඳහා නැත හොත් පිළිවෙළින් ඒ ප්‍රතිපාදන හෝ පරිත්‍යාග කරනු ලැබුවේ විශ්වවිද්‍යාලයේ යම් කාර්ය හෝ අරමුණු සඳහා ද ඒ කාර්ය හෝ අරමුණු නොවන යම් කාර්ය හෝ අරමුණු සඳහා ඒ ආදායමෙන් කිසිදු ගෙවීමක් නොකළ යුතු ය.

වාර්ෂික ඇස්තමේන්තු සහ වාර්ෂික විසර්ජන පාලක සභාව විසින් සලකා බැලිය යුතු බව.

**35.** විශ්වවිද්‍යාලයෙහි වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික විසර්ජන සහ වාර්ෂික ගිණුම් පාලක සභාව විසින් සලකා බැලිය යුතු අතර, ඒ ඇස්තමේන්තු සහ විසර්ජන පාලක සභාව විසින්, එය සුදුසු යයි කල්පනා කරන පරිදි යෝජනා සම්මතයක් මගින් පිළිගැනීම හෝ සංශෝධනය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

පරිපූරක ඇස්තමේන්තු.

**36.** අවශ්‍ය වූ විටක සහ අනපේක්ෂිත වියදම් දැරීම පිණිස මූල්‍යාධිකාරීවරයා විසින් කවර හෝ අවස්ථාවක පරිපූරක වැය ඇස්තමේන්තු පිළියෙල කිරීම ද, ඒ ඇස්තමේන්තු පාලක සභාව විසින් සම්මත කිරීම ද නීත්‍යානුකූල වන්නේ ය :

එසේ වුව ද, ඒ පරිපූරක ඇස්තමේන්තු, පාර්ලිමේන්තුව විසින් මුදල් වර්ෂය සඳහා සම්මත කරන ලද ප්‍රතිපාදනය නොඉක්මවිය යුතු අතර, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය නොමැතිව පුනරාවර්තන ස්වභාවයේ කිසිම මූල්‍ය වගකීමක් ඇති කර ගනු නොලැබිය යුතු ය

එක් වැය ශීර්ෂයකින් වෙනත් වැය ශීර්ෂයකට මුදල් මාරු කිරීම.

**37.** භාණ්ඩාගාරයේ ලිඛිත අනුමතයට යටත්ව, අවශ්‍ය කවර හෝ විටක, පාලක සභාව විසින්, වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් එක් වැය ශීර්ෂයකින් වෙනත් වැය ශීර්ෂයකට මාරු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

ගිණුම් විගණනය කිරීම.

**38.** රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන විශ්වවිද්‍යාලයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

වරිපනම් වලින් විශ්වවිද්‍යාලය නිදහස් කිරීම.

**39.** (1) යම්කිසි පළාත් පාලන ආයතනයකට කවර වූ හෝ වරිපනම් බද්දක් ගෙවීමෙන් විශ්වවිද්‍යාලය නිදහස් විය යුතු ය.

(2) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ වගන්තියෙහි විධිවිධාන බලාත්මක විය යුතු ය.

## VIII වන කොටස

## පොදු විධිවිධාන

සද්භාවයෙන් කරන ලද ක්‍රියා සඳහා වගකීමෙන් ආරක්ෂා කිරීම.

**40.** (1) මේ පනතේ කාර්ය සඳහා පත් කරන ලද, පාලක සභාවේ යම් සාමාජිකයකු, විශ්වවිද්‍යාලයේ යම් නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින්, පාලක සභාවේ විධානය මත මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සඳහා ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) විශ්වවිද්‍යාලය විසින් හෝ විශ්වවිද්‍යාලයට විරුද්ධව හෝ යම් අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී විශ්වවිද්‍යාලය විසින් දරන ලද යම් වියදමක් විශ්වවිද්‍යාලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය. තව ද එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී විශ්වවිද්‍යාලය වෙත ගෙවන ලද හෝ විශ්වවිද්‍යාලය විසින් අය කර ගන්නා ලද යම් ගාස්තු විශ්වවිද්‍යාලයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ පාලක සභාවේ විධානය මත හෝ තමා විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියෙහි තමාට විරුද්ධව පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී (1) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු විසින් දරන ලද යම් වියදමක්, එය සද්භාවයෙන් කරන ලද ක්‍රියාවක් ලෙස අධිකරණය තීරණය කරතහොත්, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අය කර ගතහොත් මිස, විශ්වවිද්‍යාලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

පුරප්පාඩු හෝ දෝෂ තිබීමේ හේතුවෙන් යෝජනා සම්මත හෝ කටයුතු අවලංගු නොවන බව.

**41.** පාලක සභාවේ කිසිම ක්‍රියාවක්, යෝජනා සම්මතයක් හෝ කටයුත්තක් එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් හෝ පුරප්පාඩු තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු හෝ සාමාජිකයන් පත් කිරීමෙහි ලා යම් දෝෂයක් හෝ දෝෂ තිබීමේ හේතුව නිසාම පමණක් අවලංගු නොවිය යුතු ය.

ත්‍යාග ආදිය.

**42.** මේ පනතට හෝ යම් නියෝගයකට හෝ අනුකූලව හැර, විශ්වවිද්‍යාලය විසින් එහි සාමාජිකයන් අතුරින් කවර හෝ සාමාජිකයකුට නැතහොත් එහි සාමාජිකයන් අතර මරණ පාරිතෝෂිකයක් නොවන යම් ප්‍රසාද මුදලක් ප්‍රදානය කිරීම හෝ යම් ත්‍යාගයක් දීම නැතහොත් පරිත්‍යාගයක් කිරීම නොකළ යුතු ය.

විශ්වවිද්‍යාලයේ සාමාජිකයකුට විරුද්ධව හෝ සාමාජිකයකුගේ දේපළට විරුද්ධව කිසිම රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**43.** විශ්වවිද්‍යාලයට විරුද්ධව පවරනු ලබන යම් නඩුවක දී පාලක සභාවේ යම් සාමාජිකයකුට විරුද්ධව හෝ විශ්වවිද්‍යාලයෙහි යම් නිලධරයකුට නැතහොත් සේවකයකුට විරුද්ධව හෝ එවැනි තැනැත්තකුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

විශ්වවිද්‍යාලයේ නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

44. දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා විශ්වවිද්‍යාලයෙහි සියලු නිලධරයන් හා සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව විශ්වවිද්‍යාලය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

45. අල්ලස් පනතේ අර්ථානුකූලව විශ්වවිද්‍යාලය උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

නියෝග.

46. (1) නියමිත සියලු කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට නියම කරන ලද හෝ බලය දෙන ලද සියලු කාරණා සම්බන්ධයෙන් හෝ පාලක සභාව විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) පාලක සභාව විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

1978 අංක 16 දරන පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු බව.

47. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන, මේ පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයට හෝ එය සම්බන්ධයෙන් හෝ අදාළ නොවිය යුතු ය.

අර්ථ නිරූපණය.

48. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අනුබද්ධායතනය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක පිහිටි යම් අධ්‍යාපන ආයතනයක් හෝ පිරිවෙනක් විසින් කළමනාකරණය කරනු ලබන්නා වූ ද මේ පනත යටතේ අනුබද්ධායතනයක් වශයෙන් පිළිගෙන ලියාපදිංචි කර ඇත්තා වූ ද යම් අධ්‍යාපන ආයතනයක් හෝ අදහස් වේ;

"අධ්‍යාපන ආයතනය" යන්නෙන්, විශ්වවිද්‍යාලයේ විභාග සඳහා අධ්‍යයන පාඨමාලා පවත්වා ගෙන යනු ලබන යම් ආයතනයක් අදහස් වේ;

"උසස් අධ්‍යාපන ආයතනය" යන්නෙහි, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"නියෝගය" යන්නෙන්, මේ පනත යටතේ පාලක සභාව විසින් සාදන ලද යම් නියෝගයක් අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 60 කි. (විදේශීය) රු. 80 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.